# සන්ධි (සඳ)

COMBINATION / Euphonic Combination

පූර්වා'පර වර්ණයන් ගැළපීම සන්ධි හෙවත් සඳ වශයෙන් 'පෙර'පර වණන් ගළපනු සඳ නම්, සදෙව් මොහොර ඈ ගී' යනුවෙන් සිදතෙහි සන්ධි පිළිබඳ ව සංක්ෂිප්ත ව සඳහන් වේ. සිදතෙහි 'සඳ අදියර' නමින් වෙන ම පරිච්ඡේදයක් සන්ධි සඳහා වෙන් කොට ඇත. එක ම වචනයෙහි ප්‍රකෘතිය හා ප්‍රත්‍යය අතර (නැතහොත් ප්‍රකෘතිය තුළ ම) හෝ වෙන් වෙන් ව ඇති පද දෙකක් එක්වීම හෝ සන්ධි නමින් හැඳින්වේ. මේ අනුව සන්ධි ප්‍රධාන ප්‍රභේද දෙකකට බෙදේ.

එනම් :

## 1. අභ්‍යන්තර සන්ධිය :-

❖ (ප්‍රකෘතිය හා ප්‍රත්‍ය අතර)

| | | |
|---|---|---|
| උද :- | මිනිස් + ආ > මිනිසා | ගොන් + උ > ගොන්නු |
| | කර + යි > කරයි | දුව + මින් > දුවමින් |

❖ (ප්‍රකෘතිය තුළ ම)

මෙය පදයක පූර්වයෙහි මධ්‍යයෙහි හෝ අපරයෙහි හෝ වශයෙන් සිදු විය හැක.

| | | | | |
|---|---|---|---|---|
| උද :- | පූර්ව : | අසිපත > සිපත | අබරණ > බරණ | හීය > ඊය |
| | | හිර > ඉර | සුරා > රා | විහිදු > වීදු |
| | | උතුම් > තුම් | ඇතුළ > තුළ | අනත් > නත් |
| | මධ්‍ය : | පොහොර > පෝර | දැකුම > දැක්ම | මහකසුප් > මහසුප් |
| | අපර : | බාහු > බා | පාද > පා | කය > කා |

## 2. බාහිර සන්ධිය :-

| | | |
|---|---|---|
| උද :- | සුර + අඟන > සුරඟන | මුල් + අසුන > මුලසුන |
| | ගුරු + උතුමා > ගුරුතුමා | ලිප් + ගල > ලිග්ගල |
| | පස් + සිල් > පන්සිල් | බුදු + අකුරු > බුදුකුරු |

මීට අමතරව සන්ධි පිළිබඳ අනුප්‍රභේද 3ක් දැක්වේ. එනම් :-

**1. ස්වර සන්ධි :-**

ලෝප, ආදේශ, ආරෝහණ වශයෙන් ස්වරයන් අතර සිදුවන සන්ධි ය. පූර්වස්වර, පරස්වරලෝප, ස්වරාදේශ, ස්වර (මිශ්‍ර සන්ධි ලක්ෂණ ද මෙහි පවතී) යන සන්ධි විධි මීට අයත් වේ.

| | | |
|---|---|---|
| උදා :- | යන + එන > යනෙන | මුනි + උතුමා > මුනිතුමා |
| | දෙ + අත > දෑත | සුර + අඟන > සුරඟ'න |
| | මල් + අසුන > මලසුන | සිත් + ඇති > සිතැති |

**2. ව්‍යඤ්ජන සන්ධි :-**

ලෝප, ආදේශ වශයෙන් ව්‍යඤ්ජන අතර සිදුවන සන්ධි ව්‍යඤ්ජන සන්ධි නම් වේ. ගාත්‍රාදේශ, පූර්වරූප, පරරූප යන සන්ධි විධි මීට අයත් වේ.

| | | |
|---|---|---|
| උදා :- | හැම > ඇම | සඳ > හඳ |
| | අත් + කරු > අත්තරු | දඬු + කම් > දඬුවම් |
| | වත් + කම් > වත්තම් | කොක් + ගල > කොග්ගල |

**3. මිශ්‍ර සන්ධි :-**

මිශ්‍ර සන්ධි යනු ස්වර ව්‍යඤ්ජන අතර සිදුවන සන්ධි ය. ස්වර, ගාත්‍රාක්ෂර ලෝප, ආගම, ද්විත්වරූප යන සන්ධි මීට අයත් ය.

උදා :- අඹ + මල් > අම්මල් පුන + උත් > පුනරුත් පොල් + අත්ත > පොල්ලත්ත

❖ සංස්කෘත ව්‍යාකරණයට අනුව ප්‍රධාන සන්ධි විධි 5 කි.

එනම් :-

1. ස්වර සන්ධි
2. ව්‍යඤ්ජන සන්ධි
3. අනුස්වාර සන්ධි
4. විසර්ග සන්ධි
5. ප්‍රකෘති සන්ධි

❖ පාලි වියරණය අනුව සන්ධි විධි 4කි.

එනම් :-

1. ස්වර සන්ධි
2. ව්‍යඤ්ජන සන්ධි
3. නිග්ගහීත සන්ධි
4. පකති සන්ධි

❖ සිංහලයේ ප්‍රධාන සන්ධි විධි දෙකක් පවතී.

එනම් :-

1. ශුද්ධ සිංහලයේ සන්ධි
2. මිශ්‍ර සිංහලයේ සන්ධි

යනුවෙනි.

**1. ශුද්ධ සිංහලයේ සන්ධි** :-

එනම් ශුද්ධ සිංහලයේ වචන ඇසුරින් සිදුවන සන්ධි ය.

උදා:- යන + එන > යනෙන                    වපර + ඇසින් > වපරැසින්

**2. මිශ්‍ර සිංහලයේ සන්ධි** :-

සංස්කෘත ආදී මාතෘභාෂාගත වචන ඇසුරින් සිදුවන සන්ධි ය.

උදා :- දේව + ආලය > දේවාලය                ලංකා + ඊශ්වර > ලංකේශ්වර

වාක් + මාලාව > වාග්මාලාව                අති + අවශ්‍ය > අත්‍යවශ්‍ය

❖ තවද 1. භාෂණ සිංහලයේ සන්ධි හා 2. ලේඛන සිංහලයේ සන්ධි යනුවෙන් ද ප්‍රභේද පවතී.

**1. භාෂණ සිංහලයේ සන්ධි** :-

කථා ව්‍යවහාරයෙහි වචන ඇසුරින් සිදුවන සන්ධි මීට අයත් වේ.

උදා :- ඕන + එකක් > ඕනෙකක්                අත + අරිංඩ > අතාරිංඩ

ඔන්න + ඕවට > ඔන්නෝවට                කොයික + ආවත් > කොයිකාවත්

**2. ලේඛන සිංහලයේ සන්ධි** :-

ලේඛනය සඳහා වචන භාවිතයේදී සිදුවන සන්ධි මීට අයත් වේ.

උදා :- මුල් + අසුන > මුලසුන                බුදු + අකුරු > බුදුකුරු

සිදත් සඟරාවෙහි සන්ධි විස්තරාත්මක ව හඳුන්වා ඇත්තේ මෙලෙසිනි.

'පෙර'පර වණන් නිසි විදිනි ගළපනු සඳ නම්

වණලොප් අදෙස් ඈ එහි ලැකියනුසරින් දන්නේ'

පූර්වා'පර වර්ණයන් සුදුසු පරිදි ගැළපීම සන්ධි නම් වේ. එහි වර්ණ ලෝප, ආදේශ ආදිය ලක්‍ෂ්‍ය (කාව්‍ය භාෂාව හා ලෝක ව්‍යවහාරය) අනුසාරයෙන් දැනගන්න.

'එබැවින් සන් සඳ ලිඟු විබත් සමස් පියෙවි

පසකිරිය ලොපදෙස් අගම් පෙර රූ දෙරූ පෙරළී

වැඩි අඩු නිපා නියම් අනියම් අවිදුමන් විදි

වී විසි වැදැරුම් වියරණ විදි සපයා'

## ❖ සිදත් සඟරාවට අනුව සන්ධි විධි නවයකි.

ඒවා නම් :-

1. පෙරසර ලොප් සඳ
2. පරසර ලොප් සඳ
3. සර සඳ
4. සරදෙස් සඳ
5. ගතදෙස් සඳ
6. පෙරරූ සඳ
7. ගත'කුරු ලොප් සඳ
8. අගම් සඳ
9. දෙරූ සඳ

යනුවෙනි.

නූතන සිංහල ව්‍යාකරණයෙහි මීට පරරූ සඳ (පරරූප සන්ධි) යනුවෙන් තවත් විධියක් එක්කොට සියල්ල 10ක් ලෙස විස්තර කෙරේ.

ඒවා නම් :-

### 1. පූර්වස්වර ලෝප සන්ධිය (පෙරසර ලොප් සඳ) :-

සන්ධි වන පද දෙකෙන් මුල් පදයේ අග ස්වරය ලොප් කොට පරස්වරය ගතකුරට පැමිණවීම මෙහිදී සිදු වේ.

- (... පෙර සර ලොපා පර සර ගතට පැමිණ වූ බැවින් පෙර සර ලොප් සඳ නම්)

උදා :- විදුරු + අවියේ > විදුරවියේ     දිගු + ආ > දිගා

දින + ඉසුරු > දිනිසුරු     කනා + ඊල් > කනීල්

බඹර + උදුළ > බඹරුදුළ     යන + එන > යනෙන

ගිරි + අග > ගිරග     සඳ + එව් > සඳෙව්

ගුණ + ඇති > ගුණැති     රිය + ඇදුරු > රියැදුරු

සුර + ඉඳු > සුරිඳු     කට + ඇති > කටැති

## 2. පරස්වර ලෝප සන්ධිය (පරසර ලොප් සඳ) :-

සන්ධි වන පද දෙකෙන් දෙවැනි පදයේ මුල් ස්වරය ලොප්වීම මෙහි දී සිදුවේ.

උදා :- මුනි + උතුමා > මුනිතුමා     පිළි + උතුරු > පිළිතුරු

තෙද + ඇති > තෙදැති     බුදු + අකුරු > බුදුකුරු

උමා + අඟන > උමාඟන     අනු + අරුත් > අනුරුත්

පූර්වස්වරය හා පරස්වරය සමාන ව ඇති විට ලොප් වන්නේ පරස්වරය බව සැලකීම සම්මත වී තිබේ.

උදා :- ගුරු + උතුමා > ගුරුතුමා     මුදලි + ඉඳු > මුදලිඳු

සුර + අඟන > සුර’ඟන     නළ + අඹ > නළ’ඹ

නිය + අඟින් > නිය’ඟින්     ගුරු + උතුමා > ගුරුතුමා

තවද අභ්‍යන්තර සන්ධි වශයෙන් එක ම පදය තුළ සිදුවන ලෝපයන් ද දැක ගත හැකි ය.

I. **ස්වර ලෝපය :-**

උදා :- අසිපත > සිපත,     අබරණ > බරණ,     අනත් > නත්

II. **ව්‍යඤ්ජන ලෝපය :-**

උදා :- හීය > ඊය,     හිර > ඉර,     හිස > ඉස,     හැර > ඇර

III. **ස්වරව්‍යඤ්ජන ද්විත්ව ලෝපය :-**

උදා :- පොහොය > පෝය     පොහොර > පෝර     පුවරුව > පෝරුව

## 3. ස්වර සන්ධිය (සර සඳ) :-

ස්වරයන් ලෝපවීම්, ආදේශවීම් සිදු නොවුන ද පූර්ව ව්‍යඤ්ජනය පරස්වරය එක්කිරීමෙන් සිදුවන සන්ධිය ස්වර සන්ධි නම් වේ. අක්ෂර සන්ධි නොහොත් ආරෝහණය නමින් ද මෙම සන්ධි විධිය හැඳින්වේ.

- (පසැස් ඈ සර ලොප් නැත ද සර ගතට පැමිණ වූ බැවින් සර සඳ නම්)

උදා :-

නිල් + අඹර > නිලඹර

සිහිල් + අඹ > සිහිලඹ

මත් + ඇත් > මතැත්

සිහින් + ඉඟ > සිහිනිඟ

නිල් + උපුල් > නිලුපුල්

ඔවුන් + ඔවුන් > ඔවුනොවුන්

මුල් + අසුන > මුලසුන

සහස් + ඇස් > සහසැස්

පින් + ඇති > පිනැති

උපන් + උපන් > උපනුපන්

එදින් + එද > එදිනෙද

ඔබින් + ඔබ > ඔබිනොබ

## 4. ස්වරාදේශ සන්ධිය (සරදෙස් සඳ) :-

පූර්වා'පර වර්ණයන් ස්වර වශයෙන් සිටින විට අ, ඉ, උ යන ස්වර ලොප් කොට ඒ වෙනුවට එ, ඔ, ඕ යන ස්වර ආදේශ වීම මෙහිදී සිදු වේ.

- (අ ඉ උ න් ලොපා එ ඔ ඕ අදෙස් කළ බැවින් සරදෙස් සඳ නම්)

එනම් :- අ + ඉ > එ

**උදා :** මහ + ඉසුරු > මහෙසුරු / මෙහෙසුරු

අ + උ > ඔ / ඕ

**උදා :** මහ + උර > මහොර / මොහොර

ලඹ + උදරා > ලඹෝදරා / ලඹෝරා

## 5. ගාත්‍රාදේශ සන්ධිය (ගතදෙස් සඳ) :-

සන්ධි වන පද දෙකෙන් පසු පදයේ මුලින් සිටින ව්‍යඤ්ජනය වෙනුවට වෙනත් ව්‍යඤ්ජනයක් ආදේශ වීම මෙහි ලක්ෂණයයි. මෙහි දී 'ක' වෙනුවට 'ව' හා 'ය' යන්න ද, 'බ' හා 'ද' හි ස්වරය ලොප් කොට ඒ වෙනුවට පිළිවෙළින් 'ප්' හා 'ත්' ද ආදේශ කිරීම ගාත්‍රාදේශ සන්ධියෙහිදී සිදු වේ.

- (..පර ක කරනට වයන් හා... බදන් සර ලොපා පතන් හා අදෙස් කළ බැවින් ගත දෙස් සඳ නම්..)

**උදා :- (බාහිර සන්ධි)**

අත් + කරු > අත්වරු

සිත් + කරු > සිත්වරු

| | |
|---|---|
| දඬු + කම් > දඬුවම් | මහණු + කම් > මහණුවම් |
| බිලි + කම් > බිලියම් | දඩ + කම් > දඩයම් |
| ගිනි + කම් > ගිනියම් | පිළි + කම් > පිළියම් |
| කිවි + වර > කිවියර | නව + කම් > නවහම් |
| කැසුබු + පොතු > කැසුප්පොතු | හෙබ + තොට > හෙප්තොට |
| සුදු + බත් > සුත්බත් | බුදු + සරණ > බුත්සරණ |

**උදා :- (අභ්‍යන්තර සන්ධි)**

| | | |
|---|---|---|
| ගෙහි > ගෙයි | ලියූ > ලිවූ | සඳ > හඳ |
| සැම > හැම | ලියුම > ලිවුම | රජු > රදු |
| සටන > හටන | රස > රහ | මසයි > මහයි |
| සොරා > හොරා | කසට > කහට | |

## 6. පූර්වරූප සන්ධිය (පෙරරූ සඳ) :-

පරරූපයේ ක කාරයට පූර්වරූපය ලැබීමෙන් සිදුවන සන්ධිය පූර්වරූප සන්ධි නම්.

- (පර ක කරනට පෙරරූ ලද්දෙන් පෙරරූ සඳ නම්)

උදා :-

| | |
|---|---|
| අත් + කම් > අත්තම් | ගෙත් + කම් > ගෙත්තම් |
| සන් + හස් > සන්නස් | ඇත් + හල > ඇත්තල |
| සිත් + කම් > සිත්තම් | විස් + කම් > විස්සම් |
| කම් + හල් > කම්මල් | වත් + කම් > වත්තම් |

## 7. පරරූප සන්ධිය (පරරූ සඳ) :-

පූර්ව පදයෙහි අගට යෙදෙන අකුර පර පදයෙහි අක්ෂරය ගැනීම මෙහි ලක්ෂණයයි. සිදතෙහි මෙම සන්ධි විධිය පිළිබඳ ව සඳහන් නොවේ.

උදා :-

| | |
|---|---|
| වප් + කඩ > වක්කඩ | ලිප් + ගල > ලිග්ගල |
| ඇත් + දළ > ඇද්දළ | වක් + පිහිය > වප්පිහිය |
| ගොප් + කොළ > ගොක්කොළ | අත් + ලස් > අල්ලස් |
| දුක් + පත් > දුප්පත් | රන් + මුතු > රම්මුතු |

| | |
|---|---|
| හක් + බෙල්ලා > හබ්බෙල්ලා | අත් + සන > අස්සන |
| රැක් + පා > රැප්පා | ලක් + ගල > ලග්ගල |

## 8. ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය (ගතකුරු ලොප් සඳ) :-

පෙර පදයෙහි අගට යෙදෙන 'ඟ', 'ඹ' යන වර්ණවල 'ග, බ' ලොප් කොට සඤ්ඤකය පූර්ණ නාසික්‍ය ශබ්දයක් බවට පත් කළ හෙයින් එම සන්ධිය ගාත්‍රාක්ෂර ලෝප නමින් හැඳින්වේ.

- (ගබන් ලොපා මත් වැඩූ බැවින් ගතකුරු ලොප් සඳ නම්)

| | | |
|---|---|---|
| උදා :- | ගඟ + රන් > ගංරන් | වඟු + මුතු > වංමුතු |
| | මුඟු + බියලි > මුංබියලි | නෙළුඹු + මල් > නෙළුම්මල් |
| | අඹ + මල් > අම්මල් | ළිඳ + පඩිය > ළිංපඩිය |
| | ගඟ + පළ > ගංපළ | ගම් + පළ > ගම්පොළ |

## 9. ආගම සන්ධිය (අගම් සඳ) :-

පූර්ව ස්වරය ලොප් නොකොට 'ය්, ව්, ර්' යන ව්‍යඤ්ජන ආගම කළ හෙයින් ආගම සන්ධි නම් වේ.

- (... පෙර සර නොලොපා යවරන් අගම් කෙළෙන් අගම් සඳ නම්)

**ව්‍යඤ්ජන ආගම :-**

| | | | |
|---|---|---|---|
| උදා :- | පිරි + අත් > පිරියත් | මී + අඟුණු > මියගුණු | සිපි + එව් > සිපියෙව් |
| | පුන + උත් > පුනරුත් | තුනු + අඟ > තුනුවඟ | කටු + අල > කටුවල |
| | වි + අවුල > වියවුල | නි + ඔද > නිරොද | නො + එක් > නොයෙක් |
| | සිව් + අඟ > සිව්රඟ | පුන + ආගමන > පුනරාගමන | |

**ස්වර ආගම :-**

| | | |
|---|---|---|
| උදා :- | තුන් + රුවන් > තුනුරුවන් | පුන් + පොහොය > පුනුපොහොය |
| | දූන් + දූ > දූනුදූ | මල් + ත් > මලුත් |

## 10. ද්විත්වරූප සන්ධිය (දෙරූ සඳ) :-

පූර්ව ස්වර ලොප් කොට එයින් පසු පදන්ත භාවයට පත්වන ව්‍යඤ්ජන ද්විත්ව කළ බැවින් ද්විත්වරූප සන්ධි නම් වේ.

- (පෙර සර ලොපා ගතට දෙරූ දනැ වූ බැවින් දෙරූ සඳ නම්)

| | |
|---|---|
| උදා :- වැලි + අවුරු > වැල්ලවුරු | හෙළිලි + අඹු > හෙළිල්ලඹු |
| තඹපලු + එන් > තඹපල්ලෙන් | කුලු + එච් > කුල්ලෙච් |
| පොල් + අත්ත > පොල්ලත්ත | වල් + අම්මබලම > වල්ලම්බලම |
| රුක් + අත්තන > රුක්කත්තන | හත් + අඩිය > හත්තඩිය |
| පත් + ඉරු > පත්තිරු | නුවණ + කාර > නුවණක්කාර |
| උරුම + කාර > උරුමක්කාර | වංශ + කාර > වංශක්කාර |

❖ ඉහත දැක්වූ සන්ධි විධි 10 මූලික ප්‍රභේද හතරකට දැක්විය හැකි ය.

එනම්.

1. අක්ෂර සන්ධිය
2. ලෝප සන්ධිය
3. ආදේශ සන්ධිය
4. ආගම සන්ධිය

යනුවෙනි.

## මිශ්‍ර සිංහලයේ සන්ධි විධි

**ස්වර :-**

■ සවර්ණ දීර්ඝ :- :-

| | |
|---|---|
| උදා :- 1. පූර්ව + අපර > පූර්වාපර | සුර + අසුර > සුරාසුර |
| දයා + අනුකම්පා > දයානුකම්පා | දෙව + ආලය > දේවාලය |
| විද්‍යා + ආලය > විද්‍යාලය | |
| 2. මුනි + ඉන්ද්‍ර > මුනීන්ද්‍ර | මහී + ඉන්ද්‍ර > මහීන්ද්‍ර |
| මුනි + ඊශ්වර > මුනීශ්වර | මහී + ඊශ්වර > මහීශ්වර |

3. ගුරු + උපදේශ > ගුරූපදේශ        සාධු + උක්ති > සාධූක්ති

**■ ගුණ සන්ධි :-**

උද :- අ + ඉ > ඒ = නර + ඉන්ද්‍ර > නරේන්ද්‍ර

ආ + ඉ > ඒ = ජිව්හා + ඉන්ද්‍රිය > ජිව්හේන්ද්‍රිය

අ + ඊ > ඒ = නර + ඊශ්වර > නරේශ්වර

ආ + ඊ > ඒ = ලංකා + ඊශ්වර > ලංකේශ්වර

අ + උ > ඕ = අරුණ + උදය > අරුණෝදය

ආ + උ > ඕ = භාෂා + උපකාර > භාෂෝපකාර

**■ වෘද්ධි සන්ධි :-**

උද :- අ/ආ + එ > ඓ = එක + එක > එකෛක

චිත්ත + එකාග්‍රතා > චිත්තෛකග්‍රතා

අ/ආ + ඔ > ඖ = ජල + ඕඝ > ජලෞඝ,    මහා + ඕඝ > මහෞඝ

**■ වෘද්ධි සමාහාර සන්ධි :-**

උද :- අ/ආ + ඓ > ඓ

සකල + ඓශ්වර්ය > සකලෛශ්වර්ය        මහා + ඓශ්වර්ය > මහෛශ්වර්ය

අ/ආ + ඖ > ඖ

ගෘහ + ඖෂධ > ගෘහෞෂධ        මහා + ඖෂධ > මහෞෂධ

**■අර්ධස්වර භාව සන්ධි :-**

ඉ, ඊ, උ, ඌ, ඍ යන ස්වරවලින් පරව විෂම ස්වරයක් යෙදුණු කල 'ඉ/ ඊ' 'ය්' බවටත් 'උ/ ඌ' 'ව්' බවටත් 'ඍ' 'ර්' බවටත් පත්වීම අර්ධභාව සන්ධි නම් වේ.

උද :- අති + අවශ්‍ය > අත්‍යවශ්‍ය        අභි + අවකාශ > අභ්‍යවකාශ

ජාති + ආලය > ජාත්‍යාලය        අති + ආදර > අත්‍යාදර

ප්‍රති + උපකාර > ප්‍රත්‍යුපකාර මහී + අධිගණ > මහ්‍යධිගණ

අනු + අර්ථ > අන්වර්ථ අනු + ඊක්‍ෂණ > අන්වීක්‍ෂණ

අනු + එෂණ > අන්වේෂණ බහු + අර්ථ > බහ්වර්ථ

පිතෘ + අර්ථ > පිත්‍රර්ථ භ්‍රාතෘ + ආදි > භ්‍රාත්‍රාදි

කර්තෘ + අභිහිත > කර්ත්‍රභිහිත

## ව්‍යඤ්ජන :-

■ **ඝෝෂීකරණය :-**

පූර්ව පදයෙහි යෙදෙන අඝෝෂ ව්‍යඤ්ජනයකින් අනතුරුව පසු පදයෙහි මුලට ඝෝෂ ශබ්දයක් යෙදුණු විට අඝෝෂ ව්‍යඤ්ජනය සවර්ණ ඝෝෂය බවට පත්වීම ඝෝෂීකරණය නම් වේ.

උදා :- දික් + විජය > දිග්විජය පෘථක් + ජන > පෘථග්ජන

ෂට් + අභිඥ > ෂඩභිඥ තත් + ආශ්‍රිත > තදාශ්‍රිත

තත් + භව > තද්භව වාක් + විද්‍යාව > වාග්විද්‍යාව

ප්‍රාක් + ධන > ප්‍රාග්ධන මහත් + අර්ථ > මහද් + අර්ථ > මහදර්ථ

■ **පදාන්ත 'ර්' විසර්ගයට බලපාන සන්ධි :-**

පදාන්ත ' ර් ' කාරයට ආදේශ වූ විසර්ගය, පරපද සම්බන්ධයේදී එහි මුල් රූපය එනම් ර් බවට පත්වේ.

උදා :- පුනඃ + ආගමන > පුනරාගමන පුනඃ + භව > පුනර්භව

පුනඃ + උක්ති > පුනරුක්ති පුනඃ + උදය > පුනරුදය

පුනඃ + උත්ථාපන > පුනරුත්ථාපන පුනඃ + ජීව > පුනර්ජීව

■ **පාර්ශ්වීකරණය :-**

'ත්' යන්නේ පර ව පාර්ශ්වීය 'ල්' කාරය යෙදුණු කල්හි 'ත්' කාරය 'ල්' බවට වෙනස් වීම පාර්ශ්වීකරණයයි.

උදා :- විද්‍යුත් + ලතා > විද්‍යුල්ලතා විද්‍යුත් + ලේඛා > විද්‍යුල්ලේඛා

උත් + ලේඛන > උල්ලේඛන

■ **ද්විත්ව රූපය :-**

ස්වරයකින් පරවූ තාලුජ මහාප්‍රාණ 'ඡ්' ද්විත්ව වන අතර මෙහි ප්‍රථම අංගය යෙදෙනුයේ අල්පප්‍රාණ 'ච්' වශයෙනි.

උදා :- ශ්වේත + ඡත්‍ර > ශ්වේතච්ඡත්‍ර    ධවල + ඡත්‍ර > ධවලඡත්‍ර

ආ + ඡාදන > ආච්ඡාදන    පරි + ඡේද > පරිච්ඡේද

ස්ව + ඡන්ද > ස්වච්ඡන්ද    උප + ඡේද > උපච්ඡේද

■ **තාලුජීකරණය :-**

'ත්' කාරයෙන් පරව තාලුජ ස්පර්ශයක් හෝ තාලුජ ඌෂ්මය (ච්, ඡ්, ජ්, ඣ්, ශ්) යෙදුණු කල්හි 'ත්' 'ශ්' බවට පත්වේ. 'ශ්' පරව ඇති විට 'ශ්' කාරය ද 'ඡ්' බවට පත් වේ. මෙලෙස සිදුවීම තාලුජීකරණය නම් වේ.

උදා :- සත් + චරිත > සච්චරිත    ශරත් + චන්ද > ශරච්චන්ද

උත් + ඡේද > උච්ඡේද    සත් + ජන > සජ්ජන

තත් + ශිෂ්‍ය > තච්ඡිෂ්‍ය

කුමාරතුංග මුනිදස මහතා සිය 'ව්‍යාකරණ විවරණ' නමැති සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයෙහි සන්ධි විධි 12ක් දක්වා තිබේ. එහි දී ඔහු සන්ධි විධි හඳුන්වා ඇත්තේ ශබ්ද සංවිධාන ක්‍රම වශයෙනි.

එම ශබ්ද සංවිධාන විධි දෙළහ මෙසේ ය.

1. මිශ්‍රණය
2. ආරෝහණය
3. ලෝපය
4. ආදේශය
5. ආගමය
6. සංක්ෂේපණය
7. සමීකරණය
8. අභ්‍යසනය
9. ආයමණය
10. සංහරණය
11. වර්ධනය
12. ක්ෂයණය

**1. මිශ්‍රණය :-**

ස්වර ශබ්ද දෙකක් එක් කොට අන්‍ය ශබ්දයක් ඇති කිරීම මිශ්‍රණය නමින් දක්වා තිබේ.

උදා :- අ + ඉ = එ : මහ + ඉසුරු = මහෙසුරු (මෙහෙසුරු)

ඉ + අ = ඒ : වි + අළ = වේල

අ + උ = ඔ : වට + උරු = වටොරු

උ + අ = ඕ : මු + අර = මෝර

එ + අ = ඇ : දෙ + අත = දෑත

**2. ආරෝහණය :-**

ස්වර ශබ්දයක් ව්‍යඤ්ජන ශබ්දයකට ආරූඪ කිරීමේ දී ඒ දෙක එකක් බවට පත් කිරීම ආරෝහණ නමි.

උදා :- මල් + අසුන = මලසුන     පස් + ඇස් = පසැස්

යක් + ඇඳුරා = යකැඳුරා     නිල් + උපුල් = නිලුපුල්

සිත් + ඇති = සිතැති     එකින් + එක = එකිනෙක

**3. ලෝපය :-**

ඇති ශබ්දයක් (අක්ෂරයක්) නැති කිරීම ලෝප නම් වේ. අබරණ   බරණ, මුවර   මෝර මෙනි. ස්වර ලෝපය හා ව්‍යඤ්ජන ලෝපය යනුවෙන් ලෝපය දෙවැදෑරුම් වේ.

(අ). ස්වර ලෝපය :- මෙය පස්වැදෑරුම් වේ. ඉන් තුනක් එක ම පදයේ සිදුවන ලෝප වශයෙන් ද දෙකක් පද දෙකක් අතර සිදුවන ලෝපය වශයෙන් ද වශයෙනි.

I. **ආදි ලෝපය :-**

අබරණ > බරණ     අනත් > නත්     අලස > ලස

අසිපත > සිපත     උතුම් > තුම්     අයුරු > යුරු

II. **අන්ත ලෝපය :-**

අග > අක් (අග්)     කඳ > කඳ් (කත්)     ගබ > ගබ්

ළිඳ > ළින්ද් (ළිං)     ටැඹ > ටැම්බ් (ටැම්)     මඟ > මං

III. **මධ්‍ය ලෝපය :-**

අතුල > අත්ල     පතුල > පත්ල     සසුන > සස්න

බැලුම > බැල්ම     සැතැපුම > සැතැප්ම     පිනුම > පින්ම (පිම්ම)

මධ්‍ය ස්වර යනුවෙන් දැක්වෙන්නේ ව්‍යඤ්ජන දෙකකට මැදි ව සිටි ස්වරයයි. මධ්‍ය ස්වරය ලොප් වීමට නම් පූර්ව ව්‍යඤ්ජනය ස්වරයක් පූර්ව කොට ඇත්තක් ද පර ව්‍යඤ්ජනය ස්වරයක් පර කොට ඇත්තක් ද විය යුතු ය. දීර්ඝ ස්වර ද 'එ ඔ' යන ස්වර ද කිසි තැනෙක ලොප් නොවේ.

**IV. පූර්ව ස්වර ලෝපය :-**

දන + ඇති > දන් + ඇති > දනැති
ඇදුරු + ආ > ඇදුර් + ආ > ඇදුරා
කොකු + අ > කොක් + අ > කොක්ක
වැනි + ඒ > වැන් + ඒ > වැන්නේ

**V. පරස්වර ලෝපය :-**

පිළි + උතුරු > පිළිතුරු
බුදු + අකුරු > බුදුකුරු
අනු + අරුත් > අනුරුත්
බො + අති > බොති

(ආ). ව්‍යඤ්ජන ලෝපය :- ව්‍යඤ්ජන ලෝපය සත් ආකාර වේ.

**I. 'ඉ' යන්නෙන් පර 'ය්' ලෝපය :-**

වියළ > වි + අළ > වේළ
කියදි > කි + අදි > කේදි
සියන > සි + අන > සේන
පිය + කඩ > පි + අ + කඩ > පේකඩ

**II. 'උ' යන්නෙන් පර 'ව්' ලෝපය :-**

මුවර > මු + අර > මෝර
තුවර > තු + අර > තෝර
පුවරු > පු + අරු > පෝරු
අදුව > අදු + අ > අදෝ

**III. පදයක ආදියෙහි 'හ්' ලෝපය :-**

හැම > ඇම
හීය > ඊය
හුදු > උදු
හොරු > ඔරු
හේ > ඒ
හෙළ > එළ

**IV. සමාන ස්වර මධ්‍යයෙහි 'හ්' ලෝපය :-**

පහර > ප + අර > පාර
බැහැර > බැ + ඇර > බෑර
මිහිරි > මි + ඉරි > මීරි
මුහුණ > මු + උණු > මූණ
මෙහෙ > මෙ + එ > මේ
පොහොය > පො + ඔය > පෝය

**ආශ්‍රිත ග්‍රන්ථ :-**


විමර්ශන සහිත සිදත් සඟරාව - කේ. ජයතිලක
වියත් සිංහලය - මදුරසිංහ ගුණතිලක
ව්‍යාකරණ රත්නාකරය - නිතලව සිරි ඤාණිස්සර නාහිමි
ව්‍යාකරණ විවරණය - කුමාරතුංග මුනිදස
සමකාලීන සිංහලය - ජේ.බී. දිසානායක
සිංහල පස්වන පොත (මූලික පිරිවෙන) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
සිංහල භාෂාඥන විකාසිනී - ඉහළගම ධම්මජෝති හිමි
සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්. එස්. කරුණාතිලක
සිංහල ව්‍යාකරණ විචාරය - ඩේවිඩ් උඩුවිල ආරච්චි
සිංහල සිව්වන පොත (මූලික පිරිවෙන) - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
සිදත් සඟරා විමසුම - මාපලගම සිරි සෝමිස්සර හිමි